# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය

**භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම BUCU – 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. ස්වභාව වස්තු වන්දනය හා දේව විශ්වාස ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන ආගමික විශ්වාස වූ බවට එලවිය හැකි සාක්ෂි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. වෛදික යුගයේ ජනතාවගේ ජීවන රටාව පදනම් කොටගෙන එම යුගයේ ආගමික චින්තනය ගොඩනැගී තිබූ ආකාරය ප්‍රකට කරන්න.

03. බ්‍රාහ්මණ සම්ප්‍රදායයේ ඉගැන්වෙන යාගයෙහි ලෞකික හා ලෝකෝත්තර අරමුණු විමර්ශනය කරන්න.

04. මානව සමාජයේ ඒකත්වය තහවුරු කිරීමට බුද්ධහම ගෙනහැර දක්වන සාධක මූලාශ්‍රය ඇසුරෙන් විමසන්න.

05. නියතිවාදය හෝ සංශයවාදය පිළිබඳ විවරණාත්මක සටහනක් සපයන්න.

06. ජීවන ගැටලු විසඳීමෙහි ලා චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය ඉවහල් වන ආකාරය ප්‍රකට කරන්න.

07. සාංසාරික ප්‍රවෘත්තිය පිළිබඳ යථාර්ථාවබෝධයට හා දෛනික ජීවිතයේ සාර්ථකත්වයට ත්‍රිලක්ෂණය පිළිබඳ ඉගැන්වීම් උපයෝගී වන ආකාරය පැහැදිලි කරන්න.

08. ශ්‍රද්ධාව බෞද්ධ නිවන් මාර්ගයේ පදනම වන ආකාරය සකාරණව පෙන්වා දෙන්න.

09. හොඳ නරක විනිශ්චයෙහිලා ඉදිරිපත් වන බෞද්ධ නිර්ණායකයන්ගේ විශ්ව සාධාරණ ලක්ෂණ ගෙනහැර දක්වන්න.

10. පුද්ගලයාගේ ස්වාධීනත්වය හා විමංසනය බුද්ධහමෙන් තහවුරු කොට ඇති ආකාරය සාකච්ඡා කරන්න.

********************************